" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01


296

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | දිනය / திகதி / Date 2022.01..6

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මුල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2021.12.31 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.09.14<br>02-80/2021 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය විද්‍යාල සභාව විසින් වසරක් පාසා පැවැත්විය යුතු ප්‍රවීණතා ඩිප්ලෝමා විභාගය 1997 වසරේ සිට නොපැවැත්වීම හේතුවෙන් සිදුවූ අසාධාරණය නිවැරදි කිරීම පිණිස ලියාපදිංචි වෛද්‍ය සේවයේ 1 වන ශ්‍රේණියට උසස් කිරීමට ගතවන කාලය සංශෝධනය කිරීම |
| 02 | 2021.12.20<br>රා.ප. චක්‍රලේඛ 25/2021 | 2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම |
| 03 | 2021.11.22<br>රා.ප. චක්‍රලේඛ 22/2021 | රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය |
| 04 | 2021.12.24<br>රා.ප. චක්‍රලේඛ 26/2021 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර |


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

| | | |
|---|---|---|
| 05 | 2021.11.24<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02-2021 | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් නොලබා විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා ශ්‍රේණි උසස් වීම් ලබා දීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවති,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2021

මගේ අංකය : EST 5/6/9/11
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.11.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය</u>**

"රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016" මැයෙන් නිකුත් කළ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හා "රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය" මැයෙන් නිකුත් කළ 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ක්‍රියාත්මක වන දිනට පෙර පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ තනතුරු තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහිලා සැලකීමට 2021.07.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. ඒ අනුව, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 11.3 වගන්තිය හා 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017හි 03 ඡේදය යටතේ ඇති 11.3 වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

> **"11.3 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ යම් තනතුරක් තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහි ලා සලකනු ලබයි."**

03. මෙම සංශෝධනය 2021.07.05 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය